# මහායාන බුදු සමයේ ප්‍රභවය පිළිබඳ විමර්ශනයක්

ඒරුවැවේ ගුණසෝම හිමි.

Mahayana is not a tradition abruptly becoming. It came to existence facing with several events over the period of time. Main roots of it had proliferated up to the period of the Buddha. The uprising of Mahayana goes up to 1st century A.D. Mahayana, specialty of it lies it's explicit way of analysis in formal steps, not taken into granted by Theravadins. Mahayanikas too, were all out to develop the Hybrid Sanskrit literature and Language. During the later period, the influence of Mahayana helped greatly, developing the concepts of the Buddha; as it had been the sole way for liberation, and the Bodhi citta, at large.

## පර්යේෂණ ගැටලුව

බුදු දහම දර්ශනයෙන් ඒකත්ත්ව වන අතර, ඉගැන්වීම් වශයෙන් විවිධ වේ. මුල් බුදු සමයේ මෙකී වර්ගවීම් නොදක්නා නමුත් පශ්චාද් සමයේ විවිධ වර්ග කිරීම් දක්නට ලැබේ. තථාගතයෝ ධරමාන කාලයේ ම මෙකී වර්ගවීම් දක්නට ලැබුණ ද තථාගත පරිනිර්වාණයෙන් අනතුරු ව නිකායාන්තර වශයෙන් වර්ග-වීම සිදු වූහ. ස්ථවිරවාදී හා මහාසංඝික යන ප්‍රමුඛ වර්ගද්වය ඇතිවීමෙන් අනතුරු ව තෙවැනි ධර්ම සංගායනාවෙන් පසු ව ගුරු කුල දහඅටකට වර්ග විය. තදනන්තර ව මහායාන - ථෙරවාද යනුවෙන් ප්‍රධාන වර්ග දෙකක් ඇති විය. සියවස් ගණනාවක් පසු-කරමින් පැමිණි ගමන් මාර්ගයේ අවසාන එළඹුම වශයෙන් මහායාන සම්ප්‍රදාය බිහි විය. ඒ අනුව මහායානයේ මූල බීජ මුල් බුදුසමයේ දක්නට ඇද් ද? මහා සංඝික ගුරු කුලයේ ම විකාසනයක් ලෙස මහායානය හැඳින්විය හැකි ද? ආදි පර්යේෂණ ගැටලු මෙහි භාවිත ය.

## අරමුණු

මෙම පර්යේෂණ පත්‍රිකාවෙන් මතු කරන අදහස වන්නේ මහායාන සම්ප්‍රදායේ ප්‍රභවය පිළිබඳ විචාරයකි. එබැවින් මහායානයේ ක්‍රමික අභිවර්ධනය පිළිබඳ අධ්‍යයනයක් මින් අපේක්ෂිත ය.

## ක්‍රමවේදය

අදාළ කරුණු ගොනු කිරීමේදී ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය භාවිත කරමින් මාතෘකාව විශද කිරීමට අපේක්ෂිතය.

## උපන්‍යාසය

මූලික එළඹුමේ දී බුදු සමය මහායාන හා ථෙරවාද යනුවෙන් ප්‍රභේද ද්වය කි. එහෙත් ක්‍රම විකාසයේ දි එය දීර්ඝ කාලීන විමර්ශනයක ප්‍රතිඵලයකි. එමෙන් ම නිකායාන්තර දර්ශනය, ඉගැන්වීම් මෙන් ම සාහිත්‍යය ද විවිධ ය. එහි ඇතැම් කරුණු අවස්ථා වශයෙන් වෙන් කරගැනීමට නොහැකි තරම් සමීප වුවත් සාම්ප්‍රදායික වශයෙන් ගුරු කුල දෙකක් ලෙස විකාසනය විය.

## සාකච්ඡාව

ක්‍රි. පූ. සයවැනි සියවසේ තථාගතයන් හඳුන්වා දුන් ධර්මය, චරණය හා දේශනය ලෙස ප්‍රභේද දෙකකි. චරණය ජීවිතාවබෝධයට හේතු වෙයි. දේශනාව තම මතය පැහැදිලි කිරීමට හා සනාථ කිරීමට උපකාරි වෙයි. වර්ෂ ගණනාවක් ඔස්සේ මෙකී සම්ප්‍රදාය දෙක ක්‍රියාත්මක විය. එක ම දර්ශනයක් ලෙස පැවති ඒකීය පිළිගැනීම ඉදිරිපත් කිරීම පශ්චාත්කාලීන ව විවිධ ඉගැන්වීම් ඔස්සේ විකාශය විය. ක්‍රි. පූ. යුගයේ ම මෙම වෙනස් වීම සිදු වූ අතර, ඉන් පැන-නැගුණු ඉගැන්වීම් කෙරෙන් විවිධ සම්ප්‍රදාය බිහි විය. එකී සම්ප්‍රදාය විකාශනයෙන් බිහි වූ 'මහායාන' සම්ප්‍රදාය විශේෂ වේ. බෞද්ධ දර්ශන ඉතිහාසයේ පශ්චාත් සංවර්ධනීය අවධිය මහායාන බුදුදහමින් පැහැදිලි වේ. කාලානුරූපී ව වර්ෂ ගණනාවක් පසු කරමින් පැමිණි ශාසන සම්ප්‍රදායේ විධිමත් දාර්ශනික එළඹුම මහායාන සමයෙන් පැහැදිලි කෙරේ. බෞද්ධ දර්ශනයේ පශ්චාත් සංවර්ධන අවධියේ මහායාන බුදු සමයේ එළඹීම චින්තනමය වශයෙන් සහ බුදුදහම පරිශීලනය කිරීමේ සැබෑ විප්ලවයක් ලෙස සැලකේ.[1] දීර්ඝකාලීන ව සිදු වූ චින්තනමය පැවත්මේ ප්‍රතිඵලයක් ලෙස 'මහායාන' නමැති අදහස බිහි වී ඇත. මෙය ක්‍රමානුකූල ව මුල් බුදුදහමේ සිට පරිණාමයට පත්වීම හා එය ප්‍රතිනිර්මාණය කරගැනිමේ ප්‍රතිඵලයක් ලෙස බිහි වූ නව සංකල්පයකි.

බුදුදහම පිළිබඳ පර්යේෂණයක යෙදුණු නලිනාක්ෂ දත් ක්‍රි.පූ. 4 හා ක්‍රි.ව. 3 අතර කාලයට සමගාමී ව බුදු දහම කොටස් තුනක් යටතේ පැහැදිලි කරයි.[2]

1. මූලික හෝ පිරිසුදු හීනයාන බුදුදහම. (ක්‍රි.පූ. 450-350)
2. මිශ්‍ර හීනයාන බුදුදහම. (ක්‍රි.පූ. 350 - ක්‍රි.ව. 100)
3. මහායානයේ සම්භවය. (ක්‍රි.ව. 100-300) යනුවෙනි.

සිද්ධාර්ථ බෝධිසත්ත්ව ජීවිතය පිළිබඳ අත්වින්ද දාර්ශනික එළඹුම බුද්ධත්වයෙන් පැහැදිලි කෙළේ ය. ලෝක ස්වභාවය ධර්මයෙන් පැහැදිලි කිරීම උන්වහන්සේ ගේ මූලික අභිප්‍රාය විය. ධර්මය ශ්‍රවණයේ තත්පර ජනයා ශ්‍රද්ධාව උපදවාගැනීමේ වැදගත්කම සලකා ඔවුන් උදෙසා ධර්ම ද්වාරය විවර කළ බව දේශනාවෙන් පැහැදිලි වේ.[3] සද්ධර්මයේ මූලික හරය කැටි කොට ගනිමින් කළ ඉගැන්වීමකි දම්සක් පැවතුම් දේශනාව. සිවුසස් දහම හා මධ්‍යම මාර්ගය නිවන් මඟට ප්‍රමාණවත් බව මෙහි දක්වයි.[4] අනිත්‍ය, දුඃඛ, අනාත්ම යන ධර්මතා අවබෝධයත් ඒ සඳහා නිවැරදි මාර්ගය ශීල, සමාධි, ප්‍රඥාව බවත් මූලික හෝ පිරිසුදු හීනයානයෙන් පැහැදිලි කෙරේ.

බුද්ධ පරිනිර්වාණයෙන් අනතුරු ව එළැඹි සංගායනාත්‍රයෙන් අවසන් වන කාල සීමාව මිශ්‍ර හීනයාන බුදුදහමේ උදාව ලෙස හැඳින්වේ. මුල් බුදුදහම ඒ ආකාරයෙන් ම සුරක්ෂිත කිරීමේ පරමාර්ථයෙන් සංගායනා පැවැත්වුණු අතර,[5] එම සංගායනා අවසන් වන විට පිරිසිදු බුදුදහම වෙනුවට මිශ්‍ර වූ දහමක් ඇති විය. එය මිශ්‍ර හීනයාන බුදුදහම ලෙස හැඳින්වේ. බුද්ධ පරිනිර්වාණයෙන් වර්ෂ සියයක් ඉක්මගිය තැන ථෙරවාද හා මහාසාංඝික වශයෙන් භික්ෂු ශාසනය බෙදී ගියේ ය. දෙවැනි සංගායනාව දශ වස්තුක දෘෂ්ටියක් නිසා පැනනැඟුණ අතර, එය කූටප්‍රාප්ත වූයේ මහාසාංඝික නමින් වෙන ම නිකායක් බිහි වීමෙනි. ඒ අනුව විවිධ ඉගැන්වීම් ඇසුරෙන් හීනයානය පෝෂණය විය. එයින් මිශ්‍ර හීනයාන බුදුදහම පැන-නැඟුණි. එහි අතුරු ප්‍රතිඵලයක් වශයෙන් තෙවැනි ධර්ම සංගායනාව පැවැත් වුණු අශෝක රාජ්‍ය කාලය වන විට ශාසනය නිකාය වශයෙන් දහ අටකට බෙදීගියේ ය. මහා සාංඝිකයන් නැවත ප්‍රභේද හයක් හා ථෙරවාදීහු ප්‍රභේද වශයෙන් දොළොස් නිකායකට බෙදී-ගියහ. ඒ ඒ නිකායයන් බුදුදහම ලෙස ඉදිරිපත් කළ ධර්මය මිශ්‍ර හීනයාන බුදුදහම ලෙසින් හැඳින් වේ. බුද්ධ පරිනිර්වාණයෙන් පසු ප්‍රථම සියවස් පහේ දී බෞද්ධ ආචාර්ය පරම්පරා ගණනාවක් පහළ වූ බවත්, එම නිකායන්ගේ සම්භවය හා ඓතිහාසික පසුබිම පරස්පර විරෝධතා සහිත ව හා අවුල් සහගත වූ බවත් එඩ්වඩ් කොන්සේ පැහැදිලි කරයි.[6] මෙම මතය සෙල්ලිපි ආශ්‍රයෙන් ලාමොට් ද දක්වයි.[7] මහායානයේ ආරම්භය කෙරෙහි මහා සාංඝිකයන් ගේ ඉගැන්වීම් ඍජුව ම උපස්තම්භක නොවූවත් මහායානයේ පූර්වගාමීන් ලෙස ඔවුහු විද්වතුන් විසින් පිළිගනු ලැබෙති.[8] මිශ්‍ර හීනයාන බුදුදහමේ කාල වකවානුව ලෙස මෙය හැඳින්වේ. ක්‍රි: වඃ පළමු සියවසේ භාරතයේ රාජ්‍ය විචාළ කණිෂ්ක රාජ සමයේ මහායාන සම්ප්‍රදාය බිහි වූ බව පිළිගැනේ. සිවුවැනි ධර්ම සංඝායනාවෙන් අනතුරු ව මෙහි ව්‍යාප්තිය හා භාවිතය සිදු විය. මහායාන යන වචනය ද තදීය කාලයට අයත් වන අශ්වඝෝෂයන් ගේ ශ්‍රද්ධෝත්පාද සූත්‍රයේ ප්‍රථම වතාවට දක්නට ලැබේ.[9] බුදුරජුන් වාසය කළ කාලයේ ම ධර්මය හා ප්‍රතිපත්ති පිළිබඳ විසංවාදී අදහස් පැවැතුණ ද එය මහායාන අදහස් තරම් ව්‍යාප්ත වීමක් නො විණි. එහෙත් කණිෂ්ක රාජ්‍ය සමයෙන් අනතුරු ව එළඹි නව සංඝ සමාජය කෙරෙන් මහායාන අදහස් පිළිබිඹු විය. එය නව සම්ප්‍රදාය නිෂ්පත්තිමය අවස්ථාවක් සඳහා භාවිත කළත් මහායානයේ ආරම්භය සිදු වූ කාල වකවානුව ගණනය කළ නො හැකි ය. නව සම්ප්‍රදායක් වශයෙන් ඇති වූ මහායානය කෙරෙහි බලපෑ ප්‍රධාන කරුණු දෙකකි.

01. මුල් බුදුදහම හා සූත්‍රගත මතවාද

02. පශ්චාද් ධර්මානුගත මතවාද වශයෙනි.

තථාගතයන් ධරමාන කාලයේ මෙන් ම උන්වහන්සේගේ පිරිනිවන් පෑම හා ආසන්න කාලයේ ථෙරවාද භික්ෂු සමාජයේ පැනනැගුණු යම් යම් තීරණාත්මක සංසිද්ධි මෙයට අයත් වේ. කොසඹෑනුවර, ඝෝෂිතාරාමයේ ධර්මධර-විනයධර භික්ෂූන් වහන්සේ අතර ඇති වූ ප්‍රශ්නය ඉන් එකකි. බුද්ධත්වයෙන් නවවැනි වර්ෂයේ සිදු වූ මෙම සිද්ධියෙන් භික්ෂු සමාජයේ යම් දෙදරා යෑමක් දක්නට ලැබේ. එයින් පශ්චාත්කාලීන ශාසන භේදයට යම් බලපෑමක් ද සිදු විය. සංඝ සමාජය ඇතුළු සමස්ත ආගමික සංවිධාන මෙහි දී ද්වි ප්‍රභේද වීම පශ්චාත්කාලීන විරසකයට පූර්ව නිමිත්තකි.

චුල්ලවග්ග පාලියට අනුව දේවදත්ත හිමියන් ඉල්ලා සිටි පඤ්චවර ඔස්සේ ද යම් බෙදීමක් සංඝ සමාජයේ විද්‍යමාන විය. ශාසන භාරධාරිත්වය අයැද එය නොලැබීයාමෙන් පසුව භික්ෂූන් දිවි ඇතිතෙක් අනුගමනය කළ යුතු පඤ්චවර ආයාචනය කරසිටීම පශ්චාත් ගැටුමකට අවැසි මඟ හෙළි කිරීමකි. භික්ෂුව දිවි ඇතිතෙක් ආරණ්‍යවාසී වීම, පිණ්ඩපාතික වීම, පාංශුකූලික වීම, වෘක්ෂ මූලික වීම හා මස් මාංසයෙන් වැළකී සිටීම[10] එකී පඤ්චවර වේ. මෙම වරයන් අනුගමනය කිරීමෙන් භික්ෂු සමාජය භේදයට පත් වේ. සැලසුම් සහගත ලෙසින් ම එකී අවස්ථාවේ ඒකීය භික්ෂූන් වහන්සේ දෙකොටසකට බෙදී-ගියහ. එකිනෙකට විග්‍රහ කර බැලීමෙන් මෙන් ම සමස්තය කැටි කොට ගැනීමෙන් ද පශ්චාත්කාලීන ව පැන නැගුණු මහායානික ප්‍රබල ඉදිරිපත් කිරීම්වල මූලික අවස්ථාව මෙයින් විද්‍යමාන වෙයි.

බුද්ධභාෂිත මාධ්‍යය පාලිය ගුරු කොටගෙන ඇත. තත්කාලීන සමාජ, දේශපාලනික මෙන් ම භෞමික ස්වභාවය කේන්ද්‍ර කරගෙන අර්ධ මාගධීය නොහොත් පාලි භාෂාව ගුරු කොටගෙන ධර්මය තථාගතයන් වහන්සේ ඉදිරිපත් කළහ. එහෙත් යමේලු හා තේලුක යන බ්‍රාහ්මණ වංශික තෙරවරුන් දෙදෙනා ඡන්දසට එනම් සංස්කෘත භාෂාවට පෙළ දහම නැඟීමට කළ ප්‍රයත්නයට තථාගතයන් ධරමාන කාලයේ ම අනුමැතියක් නො ලැබිණි. මෙය ද මහායානයේ බිහිවීමට තුඩු දුන් තවත් අවස්ථාවකි. පශ්චාත්කාලීන ව ඇති වූ මහායානයේ මාධ්‍ය භාෂාව වූයේ ද සංස්කෘතය යි. ව්‍යවහාරික භාෂාව ප්‍රායෝගික ලේඛනය උදෙසා භාවිත කිරීමෙන් අනන්‍යතාවක් ගොඩනගා ගැනීමට හැකි ය. එබැවින් ඡන්දස වශයෙන් හැඳින්වූ සංස්කෘතයට ආගමික න්‍යායයන් හැර වූ විට එම භාෂාව භාවිතයන් ගේ අනන්‍යතාව ගොනු කිරීමට ලැබෙන ඉඩ ප්‍රස්තාව විශාල ය. මෙය ද තථාගතයන් වැඩසිටි කාලයේ සිදු වූවකි. එමෙන් එම කාලයේ භික්ෂු සමාජයේ විවිධ මතධාරීහු සිටියහ. ඡබ්බග්ගිය භික්ෂූහු, සාති, උදය, සුභද්‍ර ආදි එකී කණ්ඩායම් නියෝජිතයෝ ය. තම අභිලාෂයන්ට අනුගත ව එම භික්ෂු කණ්ඩායම් ධර්ම-විනය පැහැදිලි කිරීමට ප්‍රයත්න ගත්හ. විඥානවාදය පිළිබඳ සාති භික්ෂුව ගේ හා බුද්ධ පරිනිර්වාණයෙන් අනතුරු ව සුභද්‍ර භික්ෂුව ගේ ප්‍රකාශයෙනුත් විද්‍යමාන වන්නේ ඒකීය ථෙරවාද භික්ෂු

සම්ප්‍රදාය විවිධ මතධාරීන් ගේ අදහස්වලින් යුක්ත ව පැවති බව ය. ස්වකීය මතයන්ට අනුගත ව ධර්ම විනයට විවිධ අර්ථකථන ඉදිරිපත් කිරීම මහයාන සමයේ දක්නට ලැබේ. එමෙන් ම ප්‍රථම ධර්ම සංඝායනාව පිළිබඳ ථෙරීය සම්ප්‍රදාය නියෝජනය කළ මහ තෙරවරුන් අතර එකඟතාවක් නොපැවතීම ආනන්ද තෙරුන්ට චෝදනා පහක් ඉදිරිපත් කිරීම[11] ආදියෙන් ද පැහැදිලි වන්නේ තථාගතයන් ජීවමානව වැඩ සිටිය කාලයේ මෙන් ම පරිනිර්වාණයෙන් පසු ආසන්න කාලයේ මහයාන සම්ප්‍රදාය බිහිවීමට අවශ්‍ය මූලික අවශ්‍යතා සම්පූර්ණ වූ බවයි. මෙම සිද්ධීන් ක්‍රමානුකූල ව දියුණු වීම මහායානයේ ප්‍රගමනයට හේතු වී ඇත.

පශ්චාද් ධර්මානුගත මතයන් ඔස්සේ ද මහායානයේ විකාශය පිළිබඳ ව විද්වතුන් අවධානය යොමුකර ඇත. තථාගත පරිනිර්වාණයෙන් වර්ෂ සියයක් ඉක්මවූ තැන දෙවැනි ධර්ම සංඝායනාව පැවැත්විණි.[12] දශ වස්තුක දෘෂ්ටිය මුලික කරගෙන මෙය සිදු කෙරුණි. කාලීන ව භික්ෂූන් වහන්සේ මුහුණ දුන් යම් යම් අර්බුදකාරී ස්වරූපයන්ට පිළිතුරු සෙවීමක් ලෙස මෙම දශ වස්තුක දෘෂ්ටිය ඇති විය. විශාලා මහනුවර වජ්ජිපුත්තක භික්ෂූහු මෙම දෘෂ්ටීන් සාධාරණ බව ප්‍රකාශ කළ විට ථෙරීය සම්ප්‍රදායයන් මෙය ධර්ම-විනයට පටහැනි බව දැක්වීමෙන් ඇති වූ අර්බුදය විසඳා ගැනීම උදෙසා දෙවැනි ධර්ම සංගායනාව පැවැත්වූහ. එහෙත් මහාදේව තෙරුන් ගේ පඤ්ච වස්තුව දෙවැනි සංගායනාවට මූලික වූ බව තවත් මතයකි.[13] තාරානාථ ද මෙම අදහස අනුමත කරයි.[14] පඤ්ච වස්තුවෙන් අපේක්ෂා කර ඇත්තේ එතෙක් රහතන් වහන්සේට පැවති විශේෂතාව ප්‍රශ්න කිරීමත්, එය බිඳ දැමීමත් ය. රහත් බව පිළිබඳ ද්වේෂසහගත බවක් හෝ එය ප්‍රශ්නකර නිරාකරණය කරගත යුතු ප්‍රශ්නයක් බවට පත් වීමත් ඔවුන් කෙරෙහි පැවතී ඇත. රහත් බව බුදුදහමේ පරම නිෂ්ඨාව ලෙස සැලකේ. නමුත් එය පිළිගැනීමට ඇතැම් පිරිස නැඹුරු නො වූහ. එම නිසා රහත් බව මෙන් ම රහතන් වහන්සේ පිළිබඳ ව ද ප්‍රශ්න කෙරිණි. ථෙරවාන් මෙය නිරාකරණයට ප්‍රයත්න දැරුවත් එය සිදු නොවීම මත මහායාන බුදුසමයෙන් එයට පිළිතුරු සෙවීමක් සිදු විය. සමකාලීන ජෛන ආගමේ රහත් බවට පත් ජෛන ශාස්තෘවරුන් පිළිබඳ සඳහන් කළත් බුදුදහමේ පැහැදිලි කරන රහත් බවට එය සමාන නො වී ය.[15] එහෙයින් මහායාන බුදුදහමේ රහත් බව ප්‍රතික්ෂේප කිරීමත් බෝධිසත්ත්වයන් එකී ස්ථානයට පත් කිරීම සිදු විය. රහත් බව ඉක්මවූ ස්වභාවයක් ඔවුන් බෝධිසත්ත්වයන් විෂයේ ආගමනය කර ඇත. එයට ආනුෂංගික ව ප්‍රථම ධර්ම සංගායනාවේ අනුමත කරගත් ඛුද්දානුඛුද්දක ශික්ෂාපද ඉක්ම වීමත් මෙහි අපේක්ෂාව විය. මහායානයේ ආරම්භය උදෙසා දෙවැනි ධර්ම සංගායනාව වැදගත් ය. සංගායනාව උදෙසා දොළොස් දහසක් භික්ෂූන් ඉදිරිපත් වූවත් ඉන් සත්සීයයක භික්ෂූන් පිරිසක් පමණක් එයට සහභාගී කර ගත්හ. දස දහසක් භික්ෂූන් අනුචිත, පව්ටු භික්ෂූන් ලෙස සලකා බැහැර කළහ.[16]

සෝෂිතාරාමයට රැස් වූ එම භික්ෂූහු ප්‍රාදේශීය රජකු ගේ අනුග්‍රහය මත ධර්ම සංගායනාවක් කළහ. මෙම සංගායනාව මහාසංඝික ආචාර්යවාද ලෙස හැඳින් වූහ.[17] ස්ථවිරවාද හා මහාසංඝික යනුවෙන් ප්‍රධාන නිකාය දෙකක් දෙවැනි

සංගායනාවෙන් අනතුරු ව ඇති විය. මෙම සංගායනාවෙන් ඒකීය භික්ෂු සමාජයේ භේද පැනනැඟිණි. එකී විභජනය අශෝක රාජ අවධියේ සිදු කළ තෙවැනි සංගීතිය පමණ වන විට නිකාය වශයෙන් දහ අටකට වර්ග විය.[18] ස්ථවිරවාදය එකොළොස් නිකායකටත්, මහාසංඝිකයන් නිකායන් සතකටත් වර්ග විය. තෙවැනි සංගීතියෙන් පසු ව වෙනත් නිකාය නවයක් ද බිහි විය.[19] ඒකීය සංඝ සමාජය මෙලෙසින් නිකාය වශයෙන් වර්ග වීම, මහායාන දර්ශනය ඇති වීමට බල පෑ පශ්චාද් ධර්මානුගත මත අතර ප්‍රබල කරුණකි.

අශෝක රජු ගෙන් පසුව වර්ෂ සියයක් පමණ ශාසන ඉතිහාසයේ මෙම භේදාත්මක කරුණු වර්ධනය විය. පළමු ශතවර්ෂයේ දී රාජ්‍ය විචාළ කණිෂ්ක රාජ සමය සංඝ සමාජය කෙරෙහි ඍජු ව බල පෑ සුවිශේෂී කාල වකවානුවකි. ථේරවාද-මහායාන වශයෙන් වර්ග වීම එහි ප්‍රමුඛ කාර්යයකි. රජු විසින් ශ්‍රවණිත ධර්ම විවිධ වූ හෙයින් පාර්ශ්ව තෙරුන් ගේ උපදෙස් මත ධර්ම සංගායනාවක් සිදු කිරීම දක්වා කරුණු යෙදුණි. සංස්කෘත භාෂාව මාධ්‍යය කරගනිමින්[20] සිවුවැනි ධර්ම සංගායනාව පැවැත්විණි. මෙම සංගායනාව පාර්ෂව, වසුමිත්‍ර, අශ්වඝෝෂ ආදි තෙරවරුන් ගේ අධීක්ෂණය මත පැවැත්විණි. එතෙක් පැවති ත්‍රිපිටකයට විභාෂා නමින් අටුවා ග්‍රන්ථයක් රචනා කිරීම මෙහි සිදු වූ වැදගත් සිද්ධියකි.[21]

මෙම සංගායනාව මහායානය හා සම්බන්ධ ව ඉතා වැදගත් වෙයි. මෙකී සංගායනාවෙන් අනතුරුව ශාසන ඉතිහාසයේ මහායාන යන වචනය භාවිතය එයට නිදර්ශනයකි. එහෙත් මහායානය යන්න කුමන සම්ප්‍රදායකට අයත් දැ'යි යන්න පිළිබඳ විද්වතුන් අතර ඒකමතිකත්වයක් නොමැත. කර්න් වෛතුල්‍යවාදීන් යනු මහායානිකයන් බව ප්‍රකාශ කරයි. එයට ඔහු පදනම ලෙස දක්වන්නේ වෛතුල්‍ය සූත්‍ර යනු මහායානික ධර්ම ග්‍රන්ථයන් ම යනුවෙන් දක්වමිනි. එහෙත් සෙනරත් පරණවිතාරණ මෙම මතය ප්‍රතික්ෂේප කරයි.[22] ඔහු ඒ සඳහා එන්. ඩී. මිරනොෆ් විද්වතා දැක්වූ කරුණු පදනම් කරගනියි. එමෙන් ම ආන්ධ්‍ර දේශයේ ජනප්‍රිය වූ අන්ධක නිකායිකයන් ගේ අවසන් එළඹුම මහායානය ලෙස සැලකෙයි.[23] රාහුල සාංස්කෘත්‍යායන මහායානයේ ප්‍රභවය ක්‍රි. පූ. තුන් වැනි ශත වර්ෂයේ ඇති වූ මහාසංඝික නිකායෙන් බව දක්වයි. මහාසාංඝිකයන් ගෙන් අන්ධක නිකායත්, පසුව ක්‍රි. පූ. පළමු සියවසේ දී වෛතුල්‍ය නිකායත්, එය විකාශනය වීම මත පූර්ව, අපර ශෛලියත්, ඔවුන් ගෙන් රාජගිරික හා සිද්ධාර්ථක සම්ප්‍රදායත් තදනන්තර ව ක්‍රි. ව. පළමු සියවසේ මහායාන දර්ශනය බිහි වූ බව ප්‍රකාශ කරයි.[24] බොහෝ උගත්හු මෙම අදහස අනුමත කරති.[25] කණිෂ්ක රජු ගේ ධර්ම සංගායනාවෙන් අනතුරුව ස්ථවිරවාදීන් හැර සෙසු සියලු ම නිකායිකයන් එකතු ව නිර්මාණය කරගත් ඒකීය සම්ප්‍රදාය මහායානය ලෙසින් හැඳින්වේ.[26] පළමු වතාවට මහායාන යන වචනය ව්‍යවහාර කරන ලද්දේ ද මෙම සංගායනාවෙන් අනතුරු ව ය. අශ්වඝෝෂ හිමියන් ගේ මහායාන ශ්‍රද්ධෝත්පාද නමැති කෘතියෙන් එය ප්‍රකාශ වේ.[27]

ක්‍රි. පූ. පළමු සියවසේ දී අෂ්ටසාහස්‍රිකා ප්‍රඥා පාරමිතා නමැති මහායාන සම්ප්‍රදායානුගත කෘතිය රචනා වී ඇති බව විශ්වාස කරන ඇතැම් විද්වත්තු තදීය

කාලයේ මහායානයේ සම්භවය සිදු වූ බව පිළිගනිති. එමෙන් ම නාගාර්ජුන හිමියන් ගෙන් මහායානය බිහි වූ බව ඇතමකු පැහැදිලි කරන අතර, භදන්ත අශ්වඝෝෂයන් මෙකී සම්ප්‍රදායේ ආරම්භකයා වශයෙන් ඇතමෙක් අදහස් කරති. මහායාන ශ්‍රද්ධෝත්පාද ග්‍රන්ථයේ එම වචනය භාවිත කර තිබීම එයට ප්‍රධාන හේතු ව යි. මහායානයේ පැනනැගීම සිදු වූ භූගෝලීය පරිසරය ලෙස උතුරු භාරතය හැඳින් වුවත් එම දර්ශනයේ ව්‍යාප්තිය හා බැඳුණු ප්‍රදේශය ලෙස දක්ෂිණ භාරතය හැඳින් වේ.[28] මෙයට එක් හේතුවක් ලෙස උගතුන් දක්වන්නේ මහායාන දර්ශනය ව්‍යාප්ත කිරීමට ප්‍රමුඛ දායකත්වයක් සැලසූ නාගාර්ජුන තෙරහු දක්ෂිණ ප්‍රදේශයේ වාසය කළ හෙයිනි.[29] මහායානය යනුවෙන් නව සම්ප්‍රදායක් බිහිවීමට බලපෑ ප්‍රධාන සාධක තුනක්. මුල් බුදු දහමේ සිට වජ්‍රයානය දක්වා සරල හැඳින්වීමක්. නමැති කෘතියේ දැක්වේ.[30]

01. නිකාය බුදුදහමේ බලපෑම.

02. බුද්ධචරිතාපදාන සම්පාදනය කිරීම, ප්‍රචලිත කිරීම.

03. ස්තූප වන්දනාව ජනප්‍රිය වීම.

මුල් බුදුදහම ථෙරවාද, මහාසාංඝික ආදි වශයෙන් භේදයට පත් වීම මහායානය බිහි වීමට බලපෑමක් විය. මූල ථෙරීය යැ'යි පිළිගත නොහැකි මත, අදහස් කලක් තිස්සේ ක්‍රමයෙන් අප්‍රකට ව යම් පිරිසක් අතර පැවතී ඇත. එය බුද්ධකාලයේ දී ද පැවැති අතර, පරිනිර්වාණයෙන් පසු ව එහි ව්‍යාප්තිය දියුණු විය. බෞද්ධ දාර්ශනික ඉගැන්වීම් සාමාන්‍ය ජනයා උදෙසා එතරම් ගෝචර නොවීමත්, සියල්ලන්ට පිළිගත හැකි, අනුමාන කළ හැකි, සාමාන්‍ය ක්‍රියාකාරකම් මෙම නිකායන් ඔස්සේ දැක්වීම හා මහායානයේ ද එයට සමාන වඩාත් සරල ඉගැන්වීම් ඔස්සේ චර්යාවන් චරිතායනය කිරීමත් අපේක්ෂිත හෙයින් එහි ව්‍යාප්තිය ශීඝ්‍ර විය.

එමෙන් ම සමකාලීන එනම්, ක්‍රි. ව. පළමු සියවසේ සිට හින්දු සමයට මුහුණ දිය හැකි ආගමික අවශ්‍යතාව බෞද්ධ සම්ප්‍රදායන්ට පැවැතිණි. එහි දී තථාගතයන් දේවාතිදේව, බ්‍රහ්මාතිබ්‍රහ්ම, තත්ත්වයට ආරෝපණය කිරීම කුමන හෝ බෞද්ධ සම්ප්‍රදායයක් විසින් කළ යුතු ප්‍රමුඛ කාර්යයක් විය. ථෙරවාදී ගුරු කුලයට එය සිදු කිරීමට ඇති හැකියා ව අල්ප ය. එයට හේතු වන්නේ තථාගත චරිතය සාමාන්‍ය මිනිසුන් අතර විශිෂ්ට මිනිසකු ලෙසින් ඔවුන් විසින් හුවා දක්වනු ලැබීම යි. එම නිසා බුද්ධ චරිතය වර්ණාතික්‍රාන්ත ව ඉදිරිපත් කිරීමේ කාර්යය මහා සංඝිකයන් විසින් සිදු කරනු ලැබිණි. ඒ අනුව බුදුසිරිත විවරණය කරන මූලාශ්‍රය ග්‍රන්ථ අතර නිකායානුගත කෘති පහක් අඩංගු වේ. මෙම කෘති ඔස්සේ බුද්ධ චරිතය මහත් ඉහළින් විවරණය කිරීමත්, එයට සුදුසු ප්‍රචාරයක් ලබා දීමත් අපේක්ෂා කර ඇත. එයට සාපේක්ෂ ව බෝධිසත්ත්ව චරිතය ඔප්නැංවීමත් සිදු-කොට ඇත.

ථේරවාද සම්ප්‍රදාය අනුගමනය කරන්නේ නිවන කේන්ද්‍ර කරගෙන ත්‍රිලක්ෂණය ඔස්සේ භාවනාව වඩා සිත දියුණු කරගැනීමයි. එහෙත් මහායාන සහ තදනුබද්ධ

නිකායන්හි ශ්‍රාවකයාට ආගමික සහනශීලිත්වයක් සැලසේ. එකී ශ්‍රාවකයන් තම ආධ්‍යාත්මික මෙන් ම බාහිර දියුණුව ද සලසා ගනී. ශ්‍රාවකයා ගේ අවශ්‍යතාව මත ඔවුන් ගේ ධර්මය ද පිළිපැදීම් ද වෙනස් කරගෙන ඇත. නිදර්ශනයක් ලෙස මහාසාංඝිකයන් ගෙන් බිඳීගිය චෛතියවාදීන් දැක්විය හැකි ය. පසුකාලීන ව මහායාන සම්ප්‍රදායේ චෛතිය වන්දනාව ප්‍රමුඛ කාර්යයක් විය. එහෙත් ථේරවාද සම්ප්‍රදායේ චෛතිය වන්දනය වැදගත් කොට සැලකුවත් එය නිවනට කේන්ද්‍ර වන ප්‍රධාන ඉගැන්වීමක් වශයෙන් නොසැලැකෙයි. එබැවින් ඉහත දැක් වූ කරුණු තුන විමසීමේ දී එය ද මහායාන බුදුසමය ඇති වීමට බලපෑ ආකරය විමසිය හැකි ය.

## නිගමනය

මහායානයේ ආරම්භය මෙන් ම එහි ව්‍යාප්තිය කාලාන්තරයක් ඔස්සේ සිදු වූ බව මෙයින් පැහැදිලි වේ. තථාගතයන් ධරමාන කාලයේ ම එහි ප්‍රභවයට අවශ්‍ය බීජ පැන-නැගුණු ආකාරය දැකිය හැකි ය. පසුකාලීනව ගොඩනැගුණු මහායානයට එහි යම් බලපෑමක් ඇති වූ ආකාරය ද විමසිය හැකි ය. තථාගතයන් අපූර්වත්වයෙන් විදහා දැක්වීම, බෝධිසත්ත්ව සංකල්පය විවරණය කිරීම, බෝධි චිත්තය සංවර්ධනය කිරීමාදිය මහායාන සම්ප්‍රදායේ ප්‍රමුඛ උගැන්වීම් වූ අතර, නිවන් මඟ විවරණය කර ගැනීමට බුද්ධත්වයට එළඹීම එකම මාර්ගය වශයෙන් දැක්වීමත් මෙහි අනන්‍යතාවකි.

## ආන්තික සටහන්

1 Edward j. Thomas, 1996, *The History of Buddhist Thought*, Routledge, p. 178

2 Dutt, Nalinaksha, 1998, *Buddhist Sect in India*, Delhi: Motilal Banarsidass Publishears Pvt. ltd, p.219

3 *ම.නි. 01*, අරියපරියේසන සූත්‍රය, බු.ජ.ත්‍රි.ග්‍ර.මා, පුනර් මුද්‍රණ. 2005, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල: පිටු. 410

4 *සං.නි. 05*, ධම්මචක්කප්පවත්තන සූත්‍රය, බු.ජ.ත්‍රි.ග්‍ර.මා, පුනර් මුද්‍රණ. 2005, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල: පිටු. 270

5 *චුල්ලවග්ගපාලි*, බු.ජ.ත්‍රි.ග්‍ර.මා, පුනර් මුද්‍රණ. 2005, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල: පිටු. 431

6 ටෙනිසන් පෙරේරා. (සංස්) *නිවන්මඟ සඟරාව*, 26-කලාපය, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, ප්‍රථම මුද්‍රණය, 1995. පිටු. 13

7 එම,

8 Kimura Ryukan, *Histories Study of the terms of Hinayana and Mahayana and origin of Mahayana Buddhism*. p.72

9 රාහුල හිමි, අත්තුඩාවේ, මහානාම හිමි, බඹරැන්දේ, 1970, *මහායානය*, නුගේගොඩ: දීපානි මුද්‍රණ ශිල්පියෝ, පිටු. 42

10 *චුල්ලවග්ගපාලි*, බු.ජ.ත්‍රි.ග්‍ර.මා, පුනර් මුද්‍රණ. 2005, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල: පිටු. 298

11 *චුල්ලවග්ගපාලි*, බු.ජ.ත්‍රි.ග්‍ර.මා, පුනර් මුද්‍රණ. 2005, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවලඃ පිටු. 298

12 බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, 1959, v. 2, (සංස්) *මහාවංසය*, කොළඹඃ ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, පිටු 17

13 සාසනරතන හිමි, මොරටුවේ, *ලක්දිව මහායාන අදහස්*, විසිදුනු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුවඃ පිටු. 34

14 රාහුල හිමි. අත්තුඩාවේ, මහානාම හිමි. බඹරැන්දේ, 1999, *මහායානය*, නුගේගොඩඃ දීපානි මුද්‍රණ ශිල්පියෝ, පිටු. 11

15 එම,

16 බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, 1959, v. 2, (සංස්) *මහාවංසය*, කොළඹඃ ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, පිටු 17

17 එම,

18 පඤ්ඤාකිත්ති හිමි, හිරිපිටියේ, 2001, *සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය*, කොළඹඃ ගොඩගේ පොත් මැදුර, පිටු. 07

19 එම, පිටු. 09

20 Govern, William Montgomery, 1968, *An Introduction to Mahayana Buddhism*, Varanasi: p.187

21 ibid, p.187

22 පෙරේරා. ටෙනිසන් (සංස්) 1995, *නිවන්මඟ සඟරාව, 26*-කලාපය, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, ප්‍රථම මුද්‍රණය, පිටු. 60

23 කලුපහන, ඩී.ජේ., 2003. *බෞද්ධ දර්ශනය*, තිවිර ප්‍රකාශන, කොළඹඃ පිටු 85-86

24 පඤ්ඤාකිත්ති හිමි, හිරිපිටියේ, 2001, *සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය*, ගොඩගේ පොත් මැදුර, කොළඹඃ පිටු 30-31

25 Kimura Ryukan, *Historical study of the terms Hinayana and Mahayana an the origin of Mahayana Buddhism*, p.72

26 සාසනරතන හිමි, මොරටුවේ, 1999, *ලක්දිව මහායාන අදහස්*, බොරලැස්ගමුවඃ විසිදුනු ප්‍රකාශකයෝ, පිටු. 104

27 එම, පිටු. 104

28 ගුණසේකර, පද්මා (පරි) *ඉන්දියාවේ බෞද්ධ නිකායන්*, නුගේගොඩඃ සුනෙර ප්‍රකාශකයෝ, පිටු. 300

29 එම, පිටු. 301

30 නානායක්කාර, සනත්, *මුල් බුදු දහමේ සිට වජ්‍රයානය දක්වා සරල හැඳින්වීමක්*, පිටු. 91